**මාෂ භෝග සහ ධාන්‍ය පර්යේෂණ හා නිෂ්පාදන අධිකාරිය 2013**

මාෂ භෝග සහ ධාන්‍ය පර්යේෂණ හා නිෂ්පාදන අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13(6) වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කළයුතු 2013 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වනවිටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ පමණක් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2002 මැයි 24 දිනැති අංක පීඊ/පීඑෆ් 21 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍ර ලේඛයේ 2 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2002 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

## 2.2 ක්‍රියාකාරිත්වය

2001 වර්ෂයෙන් පසු අධිකාරියේ කටයුතු අක්‍රීය වී තිබුණු අතර, ඊට අදාලව කාර්ය මණ්ඩලයක් හා පාලක මණ්ඩලයක්ද නොතිබුණි. අධිකාරියේ ඈවර කටයුතු 2012 දෙසැම්බර් 31 දිනට පෙර අවසන් කිරීමට 2012 දෙසැම්බර් 05 වැනි දින රැස්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව නියෝග කර තිබුණද, අමාත්‍යාංශය අධිකාරියේ ඈවර කටයුතු 2013 දෙසැම්බර් 31 දින වනවිටත් නිමකර නොතිබුණි.

## 2.3 මූල්‍ය ප්‍රකාශන, පොත්පත් හා ලේඛන පැවැත්වීම

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන, පොත්පත් හා ලේඛන පැවැත්වූ බවට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවීය.

## 2.4 වත්කම් හා වගකීම්වල පැවැත්ම

අධිකාරිය විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2001 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දැක්වෙන වත්කම් හා බැරකම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වත්කම් | වටිනාකම | බැරකම් | වටිනාකම |
|---|---|---|---|
| | රු. | | රු. |
| කාර්යාල උපකරණ | 357,803 | සී/ස ජනතා පොහොර ව්‍යවසාය | 317,537 |
| ස්ථාවර තැන්පතු | 4,200,000 | ගෙවිය යුතු බැංකු පොළී සඳහා බදු | 59,030 |
| ලැබිය යුතු | | | |
| ස්ථාවර තැන්පතු පොළී | 590,301 | උපචිත වියදම් | 80,000 |
| හිස් පොහොර මලු ඉතිරි තොගය | 347,555 | | |
| බැංකු ඉතිරිය | 63,676 | | |

රාජ්‍ය බැංකුවක ස්ථාවර තැන්පත් රු. 4,200,000 ක මුදලක් අධිකාරිය විසින් ආයෝජනය කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට තැන්පතු ශේෂය රු.4,916,462 ක් විය. අධිකාරිය වෙනත් රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යන ජංගම ගිණුමක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.5,001,351 ක ශේෂයක් පැවතුණි. ඒ හැර ඉහත වත්කම් හා වගකීම් සනාථ කිරීම සඳහා කිසිඳු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.